# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෘතීය පරීක්ෂණය (බාහිර) - 2010**
**2012 අප්‍රේල්/ මැයි/ ජූනි**

**මානවශාස්ත්‍ර පීඨය**

**බෞද්ධ සංස්කෘතිය - BUCU E 3015**

**බෞද්ධ සංස්කෘතියේ ශ්‍රී ලාංකේය වර්ධනය හා ආසියාතු ව්‍යාප්තිය**

**කොටස් දෙකෙන් ම ඇතුලත් වන පරිදි ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.**

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි** **කාලය : පැය 03 යි**

---

### 1 කොටස

01. ලක්දිව බුදුසමය ස්ථාපිත කරලීම සඳහා මිහිඳු හිමියන් විසින් අනුගමනය කරන ලද විවිධ ක්‍රමෝපායයන්හි සාර්ථකත්වය ඇගයීමකට ලක් කරන්න.

02. පොළොන්නරු කතිකාවත ඇසුරින් තත්කාලීන සමාජයේ ආගමික, සමාජික හා දේශපාලන තත්වයන් පිළිබඳ අධ්‍යයනයක යෙදෙන්න.

03. ලක් රජය හා ආගම අතර පැවති සම්බන්ධතාවයේ ස්වරූපය ඉතිහාසමය සාධක ඇසුරින් සාකච්ඡා කරන්න.

04. කෝට්ටේ යුගයේ පැවති ජාතික හා ආගමික ශ්‍රී විභූතිය පෘතුගීසි පාලන සමය තුළ පරිහානියට ලක් වූ ආකාරය පරීක්ෂා කරන්න.

05. දහනව වන සියවසේ මෙරට බෞද්ධ පුනරුදය උදෙසා මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමියන් ආගමික වාදවිවාද මගින් සිදු කරන ලද කාර්යභාරය පෙන්වා දෙන්න.

### 11 කොටස

06. කෝසල ජනපදය බුද්ධකාලීන ශාසන ව්‍යාප්තියෙහි ලා කෙතෙක් දුරට වැදගත් වූයේද'යි සනිදර්ශිතව දක්වන්න.

07. ධර්මාශෝක රජතුමාගේ විදේශීය ධර්මදූත ව්‍යාපාරය පිළිබඳ හැඳින්වීමක් කොට එහි සඵලත්වය මූලාශ්‍රයානුසාරයෙන් සනාථ කරන්න.

08. චීනයේ බුදුදහම ප්‍රචලිත කරලීම සඳහා හැං වංශික රාජ පරම්පරාවෙන් ඉටු වූ මහඟු සේවාව විස්තර කරන්න.

09. ජපානයේ කමාකුරා යුගයේ දී බුදුසමය පොදු ජන අවශ්‍යතාවලට ගැලපෙන ආගමක් බවට පත් කළ ආකාරය සාකච්ඡා කරන්න.

10. පහත සඳහන් මාතෘකා දෙකකට (02) ප්‍රමාණවත් විස්තර සපයන්න.

1. සියම් සංඝ පාලන ක්‍රමය
2. ශෛලේන්ද්‍ර රාජ වංශය
3. අනෞරථ රජතුමා
4. ශ්‍රොං සං - ගම්පො (Sroin-tsan-sgam-po) රජතුමා

*************************************